# INFORMATION AND COMMUNICATION TECHNOLOGY AND SOCIETY

(Part-I)

# විනෝදාස්වාදය සඳහා තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය

## තොරතුරු හා සන්නිවේදන තාක්ෂණයේ පරිණාමයත් සමගින් නිර්මාණය වූ උසස් ගණයේ චිත්‍රපට තාක්ෂණයන්

- ත්‍රිමාන රූප තාක්ෂණය (3D - three-dimension)
- හොලෝග්‍රැෆික් ප්‍රතිබිම්බ සැකසීමේ තාක්ෂණය
- (Holographic image processing technology)
- කාටූන් චිත්‍රපට
- අංකිත ශ්‍රව්‍ය සංස්කරණය
- අංකිත/සංඛ්‍යාංක ක්‍රීඩා (Digital games)
- සමරූපණ ක්‍රීඩා (Simulation games)

ClassWork.LK

# තොරතුරු හා සන්නිවේදන තාක්ෂණය භාවිතයේ දී ඇති වන ගැටලු

## නෛතික ගැටලු

- පෞද්ගලික දත්ත සොරා ගැනීම.
- අනවසරයෙන් පරිගණක පද්ධතිවලට පිවිසීම.
- වංචා
- බුද්ධිමය දේපළ සොරා ගැනීම.

පුද්ගලයෙකු හෝ ආයතනයක් හෝ විසින් කරන ලද නව නිර්මාණයක් එනම් මින් පෙර භාවිතයේ නොපැවති හෝ ජනතාව විසින් දැනුම්වත් ව නොතිබූ හෝ නව නිෂ්පාදනයක් හෝ ක්‍රියාවලියක් හෝ **බුද්ධිමය දේපළක්** ලෙස හැඳින්විය හැක.

බුද්ධිමය දේපළවල නෛතික ආරක්ෂාව සඳහා පේටන්ට් බලපත්‍රයක් ලබා ගත හැකි ය.

ClassWork.LK

## සදාචාරාත්මක ගැටලු

### ලිඛිත දෑ සොරකම (Plagiarism)

නිර්මාණකරුවකුගේ අදහස්, රචනා හෝ වෙනත් නිර්මාණයක් පිටපත් කර ගනිමින් ඔහුගේ අවසරයකින් තොර ව එය තමාගේ නිර්මාණයක් ලෙස ඉදිරිපත් කිරීම ලිඛිත දෑ සොරකම හෙවත් රචනා සොරකම නම් වේ.

## භෞතික ගැටලු සහ තාර්කික ගැටලු

### භෞතික ආරක්ෂාව (Physical Security)

### අනවරත බල සැපයුම (Uninterrupted Power Supply - UPS)

විදුලි විසන්ධි වීමක දී පරිගණක පද්ධතියට සිදු වන හානිය වළක්වා ගැනීම සඳහා අනවරත බල සැපයුමක් හරහා පරිගණකයට විදුලිය ලබා දීම යෝග්‍ය වේ.

- දෘඪ ගිනිපවුරු (Hardware firewalls)
- සංවෘත පරිපථ රූපවාහිනී (CCTV)
- සර්ජන ආරක්ෂක (Surge protector)

ClassWork.LK

පරිගණක විද්‍යාගාරයක ඇති පරිගණක ඇතුළු අනෙකුත් විදුලි උපාංග සඳහා සැපයෙන විදුලි බලයෙහි වෝල්ටීයතාව පාලනය කිරීම සඳහා යොදා ගනු ලබයි.

පාරිසරික සාදක වලින් ආරක්ෂා කර ගැනීම.

**<u>තාර්කික ආරක්ෂාව (Logical Security)</u>**

- මුරපද (Passwords) යෙදීම.
- මෘදු ගිනිපවුරු (Software firewalls) භාවිතය
- අනුපිටපත් (Backups) තබා ගැනීම.

ClassWork.LK

## හානිකර මෘදුකාංග

### හානිකර මෘදුකාංග විසින් පරිගණකවලට සහ පරිගණක ජාලවලට කරනු ලබන හානි

- පරිගණකයේ කාර්යක්ෂමතාව අඩු කිරීම.
- පරිගණක මෘදුකාංග විනාශ කිරීම සහ අකර්මණ්‍ය කිරීම.
- වෙනත් මෘදුකාංග ස්ථාපනයට නොහැකි වීම.
- පරිගණක දෘඩාංග අඩපණ කිරීම.
- පරිගණක ජාල කඩාකප්පල් කිරීම.
- දත්ත සොරකම් කිරීම සහ විනාශ කිරීම.
- අනවශ්‍ය ලේඛන සහ ගොනු එකතු කිරීම නිසා දෘඪ තැටියෙහි ධාරිතාව අඩු වීම.

### හානිකර මෘදුකාංග වර්ග

**පරිගණක වෛරස (Computer virus)**

පරිගණක වැඩසටහනක් හා සම්බන්ධ වෙමින් තමාගේ පිටපත් පරිගණකය තුළ පතුරුවයි.

ClassWork.LK

## පරිගණක වර්ම්ස් (Computer worms)

වෛරස හා සමාන ලෙසින් ක්‍රියාකරයි. නමුත් වර්ම්ස්වලට තනි ව ම ක්‍රියාත්මක වීමේ සහ පැතිරීමේ හැකියාවක් ඇත.

## ඔත්තුකරුවන් (Spyware)

අව්‍යාජ බවක් පෙන්නුම් කරන නමුත් හානිකර මෘදුකාංගයක් වන මෙය පරිශීලකයා නොදැනුවත් ව ම පද්ධතියට සම්බන්ධ වෙයි.

## අනවශ්‍ය දැන්වීම් (Adware)

අනවශ්‍ය දැන්වීම් පරිගණක තිරය මත දර්ශනය කිරීම.

## බොට්ස් (Bots)

අනෙකුත් ජාල සමග සම්බන්ධතා තබාගන්නා ස්වයංක්‍රීය ව ක්‍රියාත්මක වන හානිකර මෘදුකාංගයකි.

ClassWork.LK

## කොල්ලකරුවා (Hijacker/ Browser hijacker)

පරිශීලකයා අන්තර්ජාලය හා සම්බන්ධ වන අවස්ථාවේ දී ඔහු නොමග යවමින් වෙනත් වෙබ් පිටු වෙත එම සම්බන්ධතාව යොමු කරනු ලබයි.

## ෆිෂින් (Phishing)

පරිශීලකයන් රවටා ඔවුන්ගේ බැංකු ගිණුම් හෝ විද්‍යුත් ගිණුම් ආදියෙහි තොරතුරු ලබා ගැනීම.

## ආයාචිත තැපෑල (Spam)

අනවසරයෙන් ලැබෙන විද්‍යුත් තැපැල්, ආයාචිත තැපෑල ලෙස හැඳින්වේ.

ClassWork.LK

## හානිකර මෘදුකාංගයන්ගෙන් පරිගණකයක් සහ පරිගණක ජාලයක් ආරක්ෂා කරගැනීම

- පරිගණකයට වෛරස් ආරක්ෂක මෘදුකාංගයක් ස්ථාපනය කර ගැනීම.
- සෑම විට ම නීත්‍යනුකූල වූ මෘදුකාංග පරිගණකයට ස්ථාපනය කර ගැනීම.
- මෘදුකාංග හෝ වෙනත් බාගත කිරීම් සඳහා ආරක්ෂිත වෙබ් අඩවි පමණක් ම තෝරා ගැනීම.
- තමන්ගේ රහසිගත තොරතුරු, ආරක්ෂාව පරීක්ෂා කිරීමෙන් තොර ව වෙබ් අඩවි සඳහා ඇතුළු නො කිරීම.
- ගිනි පවුර/සුරැකුම් පවුර (Firewall), වෛරස ආරක්ෂක මෘදුකාංග (Virus guards), විද්‍යුත් තැපැල් පෙරන (email filters) භාවිතය.

ClassWork.LK

## වෛරස් ආරක්ෂක මෘදුකාංග

Avira Antivirus
Kaspersky Antivirus
Panda Cloud Antivirus [ B ]
Microsoft Security Essentials
Norton Antivirus
BitDefender Antivirus
McAfee Antivirus
Avast Antivirus
K7 Antivirus
Digital Defender Antivirus
Norman Antivirus
AVG Antivirus

## අන්තර්ජාල, තොරතුරු හුවමාරුව සඳහා ශ්‍රී ලංකාව තුළ ආරක්ෂාව සපයන ආයතන

- ශ්‍රී ලංකා හදිසි පරිගණක සූදානම් සංසදය (Institution for Information Security of Sri Lanka)
- ICTA ආයතනය
- ශ්‍රී ලංකා හදිසි පරිගණක සූදානම් සංසදය (Sri Lanka Computer Emergency Readiness Team - CERT)

ClassWork.LK

ClassWork.LK